ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන
හයවන මට්ටම - 2022/2023
අවසාන පරීක්ෂණය 2023
STU6410 -යෞවනයින් පිළිබඳ මනෝවිද්‍යාව
කාලය- පැය තුනයි. (03)

---

දිනය - 2023.11.22 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

01. නව යෞවනයකු තුළ සංවර්ධනය වන ප්‍රජානන හැකියා පහක් (05) ලැයිස්තුගත කරන්න.

02. නවයොවුන් වියෙහි සංවර්ධනය පිළිබඳ ජීව විද්‍යාත්මක-පරිණතිය හා සම්බන්ධ පර්යාලෝකය තුළින් ඉදිරිපත් කර ඇති මූලික අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ස්ත්‍රීන් සහ පුරුෂයින් සඳහා සුදුසු උදාහරණ දෙක (02) බැගින් දෙමින් "ද්විතියික ලිංගික ලක්ෂණ" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද යන්න විස්තර කරන්න.

04. රොබර්ට් හැවිග්හර්ස්ට් [Robert Havighurst] (1972) විසින් හඳුන්වා දෙන ලද නව යොවුන් වියෙහි සංවර්ධනාත්මක කාර්යයන් පහක් (05) ලැයිස්තුගත කරන්න.

05. නව යොවුන් විය තුළ සිදු වන චිත්තවේගික සංවර්ධනයෙහි ලක්ෂණ දෙකක් (02) කෙටියෙන් විභාග කරන්න.

06. "ඇල්බර්ට් බැන්ඩූරා (Albert Bandura) විසින් ඉදිරිපත් කරන ලද සමාජ ඉගෙනුම් ප්‍රවේශයට අනුව සමාජ අන්තර්ක්‍රියා පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපෑනු ලබන වැදගත් සාධකයකි." සමාජ ඉගෙනුම් ප්‍රවේශයේ මූලධර්ම වෙත යොමු දක්වමින් නව යෞවනයින් හා සම්බන්ධ ප්‍රධාන කරුණු දෙකක් (02) මත පදනම් ව ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

07. මත්ද්‍රව්‍ය දුර්භාවිතය නව යෞවනයකුගේ සමස්ත සංවර්ධනයට බාධාකාරී විය හැකි ආකාර දෙකක් (02) විශ්ලේෂණය කරන්න.

08. නව යෞවනයින්ගේ සමාජ අභිරුචි දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. "චිත්තවේග, නව යෞවනයකුගේ සංවර්ධනය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි."

(i) නව යෞවනයින්ගේ පොදු චිත්තවේග රටා දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් කළ චිත්තවේග නව යෞවනයකුගේ සමාජ සංවර්ධනයට බලපෑ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අවම වශයෙන් ප්‍රධාන උපායමාර්ග තුනකට (03) වත් යොමු දක්වමින් පංතිභාර ගුරුවරයෙකු විසින් නව යෞවනයින්ට තම චිත්තවේගීමය ගැටළු විසඳා ගැනීමට උපකාර කළ හැකි ආකාරය විභාග කරන්න. (ලකුණු 10)

10. "ස්වාධීන වීම නවයොවුන් වියේ සිදු වන ප්‍රජානන සංවර්ධනය හේතුවෙන් පැන නගින අවශ්‍යතාවයකි."

(i) නව යෞවනයින් ස්වාධීන වීම ඔවුන්ට වැදගත් වන්නේ මන්ද යන්න කෙටියෙන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 04)

(ii) විශේෂයෙන් ශ්‍රී ලාංකීය සන්දර්භයට යොමු දක්වමින් ඉහත සඳහන් කළ අවශ්‍යතාවය නව යෞවනයින් සහ ඔවුන්ගේ දෙමාපියන් අතර ගැටුම් ඇති වීමට හේතු වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) දෙමාපියන් විසින් නව යෞවනයින්ට ස්වාධීන වීම සඳහා උපකාර කළ හැකි ආකාරය ප්‍රධාන උපාය මාර්ග තුනක් (03) අවධාරණය කරමින් පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. (i) පිළිගත් නිර්වචනයක් උපුටා දක්වමින් "පෞරුෂය" යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නව යෞවනයකුගේ "ස්ව-සංකල්පය" සහ ඔහුගේ/ඇයගේ පෞරුෂය අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) කාල් රොජර්ස් (Carl Rogers) විසින් ඉදිරිපත් කරන ලද අදහස් පාසල් පරිපාලනය විසින් නව යෞවනයින් තුළ යහපත් ස්ව-සංකල්පයක් සංවර්ධනය වීම සුසාධ්‍ය කිරීම සඳහා යොදා ගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i) "නවයොවුන් විය මිනිස් ජීවිත කාලය තුළ විශේෂ අවධියක් ලෙස හඳුනා ගැනීම, සාපේක්ෂව නව සමාජමය සොයා ගැනීමකි."

නවයොවුන් විය මිනිස් ජීවිතය තුළ වැදගත් අවධියක් ලෙස හඳුනා ගැනීමට හේතු වී ඇති සාධක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) නව යෞවනයකු තුළ සහ මුල් ළමා වියෙහි පසුවන ළමයකු තුළ තිබෙන ආත්ම කේන්ද්‍රීය භාවයෙහි ස්වාභාවය සසඳන්න. (ලකුණු 06)

(iii)(අ) ආත්ම-කේන්ද්‍රීය බව නව යෞවනයකු තුළ ඇති කළ හැකි ගැටළු දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 01 x 02 = 02)

(ආ) ඉහත (අ) යටතේ ඔබ සඳහන් කළ **එක් (01)** ගැටළුවක් ජය ගැනීම සඳහා දෙමාපියන් විසින් නව යෞවනයින්හට උපකාර කළ හැක්කේ කෙසේ ද යන්න ඔවුන් විසින් භාවිතා කළ හැකි සුවිශේෂී උපාය මාර්ග දෙකක් **(02)** පැහැදිලි කරමින් විභාග කරන්න. (ලකුණු 08)

13. (i) ගුරුවරයෙකු ලෙස ඔබ ඔබගේ නව යෞවන ශිෂ්‍යයින් තුළ සංවර්ධනය කිරීමට කැමැත්තක් දක්වන ආකල්ප සහ වටිනාකම් හතරක් **(04)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 01 x 04 =04)

(ii) එම ආකල්ප සහ වටිනාකම් නවයෞවන ශිෂ්‍යයින් තුළ සංවර්ධනය කිරීම සඳහා උත්සාහ දැරීමේ දී ඔබට මුහුණ පෑමට සිදු විය හැකි අභියෝග දෙකක් **(02)** සාකච්ඡා කරන්න. (ලකුණු 03 x 02 =06)

(iii) ගුරුවරයකු ලෙස ඔබ ඉහත (ii) යටතේ සඳහන් කළ අභියෝග දෙක **(02)** ජය ගන්නේ කෙසේ ද යන්න එක් එක් අභියෝගය සමඟ ක්‍රියා කිරීමේ දී යොදා ගත හැකි උපායමාර්ග අවම වශයෙන් එක **(01)** බැගින් සඳහන් කරමින් විභාග කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.